Department o ibaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sab vince/ W f Education,Sabaragamuwa Province/ We rtment a Province/ Weekly School Department o ibaragam kly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Prov a Province/ Weekly School Department of Education,Sabara Dep School Department of Education,Sabaragamuwa Provin Edu f Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : ගණිතය

සතිය :1

11 ශ්‍රේණිය
ප්‍රතිශත

හීන වන ශේෂයට පොලිය ගණනය කිරීම

- අනුපමා මාස 5කදී සමාන කොටස් ලෙස ගෙවීමට රු. 5 000ක් ණයට ගන්නවා යැයි ද, ණය මුදල සඳහා 2% ක මාසික පොලී අනුපාතිකයක් අය කරනවා යැයි ද සිතමු.
  එවිට මාසයක දී ගෙවිය යුතු ණය මුදලේ කොටස $= රු. \frac{5\,000}{5}$
  $= රු.\ 1\,000$
- **<u>මාසයක දී ගෙවිය යුතු ණය මුදලේ කොටසට මාස ඒකකයක් යැයි කියනු ලැබේ</u>**
- ඉතිරි වන ණය මුදලට පොලිය ගණනය කිරීම **<u>හීන වන ශේෂයට පොලිය ගණනය කිරීම</u>** ලෙස හඳුන්වයි.

	ණය මුදල	මාසික පොලිය	පොලිය ගෙවිය යුතු මාස ඒකක ගණන
1 මාසය	රු 5 000	රු $5000\times\frac{2}{100}$ = රු 100	5 (රු 1000 පොලිය මෙන් පස් ගුණයක්)
2 මාසය	රු 4 000	රු $4000\times\frac{2}{100}$ = රු 80	4
3 මාසය	රු 3 000	රු $3000\times\frac{2}{100}$ = රු 60	3
4 මාසය	රු 2 000	රු $2000\times\frac{2}{100}$ = රු 40	2
5 මාසය	රු 1 000	රු $1000\times\frac{2}{100}$ = රු 20	1
එකතුව		රු 300	15

මාස ඒකකයට පොලිය $= රු 1000 \times \frac{2}{100} = රු\ 20$

පොලිය ගෙවිය යුතු මාස ඒකක ගණන = 15

ගෙවිය යුතු මුළු පොලිය $= රු\ 20 \times 15 = රු\ 300$

ඉහත ගැටළුව පහත ආකාරයට විසඳමු.

මාස ඒකකයක වටිනාකම $= රු\frac{5000}{5}$

$= රු 1000$

මාස ඒකකයකට මාසික පොලිය $= රු\ 1000\times\frac{2}{100}$

$= රු\ 20$

පොලිය ගෙවිය යුතු මාස ඒකක ගණන $= \frac{5}{2}\times(5+1)$

$= 15$

ගෙවිය යුතු මුළු පොලිය $= රු\ 20 \times 15$

$= රු\ 300$

ආපසු ගෙවිය යුතු මුළු මුදල $= රු\ 5000 + 300$

$= රු\ 5300$

සමාන මාසික වාරිකයක වටිනාකම $= රු\frac{5300}{5}$

$= රු\ 1060$

අභ්‍යාස

වාර්ෂිකව 36% ක පොලී අනුපාතිකයක් අය කරන එක්තරා මුලාශ්‍ර ආයතනයකින් මාස 12 කදී ගෙවීමට රුපියල් 60 000 ක් සුනිල් ණයට ගනී. සමාන මාසික වාරිකයක වටිනාකම සොයන්න.

මාස ඒකකයක වටිනාකම $= රු\frac{60\,000}{.....} = රු$ .....

මාස ඒකකයකට මාසික පොලිය $= රු$ .....$\times\frac{36}{100}\times\frac{1}{12}$

$= රු.$ .....

පොලිය ගෙවිය යුතු මාස ඒකක ගණන $=\frac{12}{...}(....+1)$

$= 78$

ගෙවිය යුතු මුළු පොලිය $= රු.$ .....$\times$ .....

$= රු$ .....

ගෙවිය යුතු මුළු මුදල $= රු$ .....+.....= .....

සමාන මාසික වාරිකය $= රු.\frac{.....}{12} =$ .....

- ගණිතය පෙළ පොතේ 9 . 1 අභ්‍යාසය